තොරතුරු මාසිකය

# විමර්ශන

2023 මැයි
ජනතා විමුක්ති පෙරමුණේ
අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි.

ලෝකය වෙනස් කිරීමට වෙනස් වෙමු!

# IMF ණය ගැනීම

**'අයි.එම්.එෆ්.' (IMF) ණය ගැනීම සියලු අර්බුදවලට විසඳුමක් යැයි සමහර අය සිතා සිටියද. එය සැබෑ ලෙසම විසඳුමක් නොවන බව ඔවුන් විසින්ම ඉදිරිපත් කරන ලද සංඛ්‍යා දත්තවලින් තහවුරු වේ. ණය ගැනීම සහ ඒවා වංචා කිරීම නිසාම බංකොළොත් වූ ආර්ථිකයකට තවත් ණය ගැනීමකින් ගොඩ යා හැකි යැයි සිතීමම විහිළුවකි. මෙම 'අයි.එම්.එෆ්.' විසඳුම තුළ තව දුරටත් අන්තර්ගත වන්නේ ශ්‍රී ලංකාව දිගුකාලීනව ණය බරින් නිදහස් වීමක් නොව තව දුරටත් ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල ණය උගුල්වලම සිරවීමයි. එය මෙම 'අයි.එම්.එෆ්.' යෝජනාවලිය තුළම අන්තර්ගත වේ. එම යෝජනාවලට අනුව ලංකා ආණ්ඩුවට පැවරෙන කොන්දේසි ගණනාවක් ඇති අතර, ඒවා බොහෝවිට ප්‍රායෝගික නොවන මට්ටමේ පවතිනවා පමණක් නොව ඒවා ඉටු කිරීමෙන්ද ආර්ථිකයට කිසිදු සහනයක් හෝ වාසියක් අත් නොවන බව නම් පැහැදිලිය.**

2022 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව 2022 වසර අවසන් වන විට මුළු රාජ්‍ය ණය ප්‍රමාණය පහත පරිදි වේ:

| විස්තරය | වර්ෂය | | |
|---|---|---|---|
| | 2022 | 2021 | 2020 |
| **දේශීය ණය** | **15,033** | **11,097** | **9,065** |
| භාණ්ඩාගාර බිල්පත් | 4,114 | 2,270 | 1,620 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 8,709 | 6,966 | 5,713 |
| වෙනත් ණය | 2,210 | 1,860 | 1,731 |
| **විදේශීය ණය** | **12,458** | **6,516** | **6,052** |
| එකතුව | 27,492 | 17,614 | 15,117 |

ඉහත දේශීය ණය තුළ ඇති භාණ්ඩාගාර බැඳුම්කරවලින් රුපියල් බිලියන 3,883ක බැඳුම්කර මිලට ගෙන ඇත්තේ දේශීය බැංකු සහ මූල්‍ය ආයතනයි. සේවක අර්ථසාධක අරමුදල සහ අනෙකුත් අරමුදල් රුපියල් බිලියන 3,725ක බැඳුම්කර මිලට ගෙන ඇති අතර ණය කපාහැරීමක් සිදුවුවහොත් ඉහත ආයතන අවදානම් තත්ත්වයකට පත් වේ.

මෙම ණය ප්‍රමාණය 2022 වසරේ ඩොලර් අගයෙන් ප්‍රකාශ කළහොත්, එය දේශීය ණය ඩොලර් බිලියන 41.5ක් වන අතර, විදේශීය ණය ඩොලර් බිලියන 42.1ක් පමණ වේ. ඒ අනුව මුළු ආණ්ඩුවේ ණය ඩොලර් බිලියන 83.6ක් පමණ වේ.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළ වන්නේ මෙම ප්‍රමාණයයි.

මෙම ණය ප්‍රතිව්‍යුහගත කිරීමට අනුව ලංකා රජය පහත පරිදි එම ආයතනවලින් ණය ලබාගත යුතු අතර, එම ණය ලබා ගැනීම 2028 දක්වා දිව යයි. ඒ අනුව 2028 වන විට ඩොලර් බිලියන 20.09ක ණය ප්‍රමාණයක් ලබා ගත යුතුය. 2022 වසරේ ලබා ගත යුතු මුළු ණය ප්‍රමාණය ඩොලර් බිලියන 3.672ක් වන අතර, එයින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලැබෙන්නේ ඩොලර් මිලියන 663ක් පමණි. එක් එක් වසර සඳහා ලබා ගත යුතු ණය සහ ආයතන පහත වගුවෙන් දක්වා ඇත. මෙම අයි.එම්.එෆ්. යෝජනාව ක්‍රියාත්මක කිරීමට වසර 06කෙදී ඩොලර් බිලියන 14.087ක ණය කපාහැරීමක් (Hair Cut) විදේශ ණය හිමියන්ගෙන් ලබා ගත යුතුය. එය 2023 වසරේ ඩොලර් බිලියන 3.376ක් පමණ වේ. මෙය පහත සටහනේ දෙවන පේළියෙහි දැක්වේ.

**ලබා ගත යුතු ණය - ඩොලර් බිලියන**

| විස්තරය | වර්ෂය | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | Total |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 0.663 | 0.665 | 0.663 | 0.662 | 0.329 | - | 2.982 |
| ලෝක බැංකුව | 0.250 | 0.400 | 0.400 | 0.400 | 0.300 | - | 1.750 |
| ආසියානු සංවර්ධන බැංකුව | 0.650 | 0.450 | 0.300 | 0.300 | 0.300 | - | 2.000 |
| ද්විපාර්ශ්වික / බහු පාර්ශ්වික | 2.109 | 1.542 | 1.585 | 1.633 | 1.682 | 1.732 | 10.283 |
| ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර | - | - | - | - | 1.500 | 1.575 | 3.075 |
| **ලබා ගත යුතු මුළු ණය** | **3.672** | **3.057** | **2.948** | **2.995** | **4.111** | **3.307** | **20.090** |

**ණය කපාහැරීම් සහ ගෙවිය යුතු ණය - ඩොලර් බිලියන**

| විස්තරය | වර්ෂය | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | Total |
| ගෙවිය යුතු මුළු ණය වාරික හා පොලී | 5.452 | 5.200 | 5.494 | 4.477 | 3.861 | 3.426 | 27.910 |
| ණය කපාහැරීම් | 3.376 | 3.328 | 3.655 | 2.246 | 1.482 | - | 14.087 |
| සත්‍ය ගෙවිය යුතු ණය | 2.076 | 1.872 | 1.839 | 2.231 | 2.379 | 3.426 | 13.823 |

ඉහත සියලු කාරණා සැලැකිල්ලට ගත්කල වසර 06ක කාලයක් තුළ ලබා ගැනීමට බලාපොරොත්තු වන මුළු ණය ප්‍රමාණය ඩොලර් බිලියන 20.09ක් වන අතර, එයින් ණය ගෙවීමට වැය වන්නේ ඩොලර් බිලියන 13.82ක ප්‍රමාණයකි. ඒ අනුව ගෙවන මුළු ණය ප්‍රමාණයට වඩා වැඩි මුදලක් ණය ගැනීමටද සිදුවී තිබේ. මේ සඳහා වසර 06 තුළ ඩොලර් බිලියන 14.087ක ණය කපාහැරීමක්ද සිදුවිය යුතුය.

ඒ අනුව අයි.එම්.එෆ්. යෝජනාවලිය ක්‍රියාත්මක කිරීම සරල, පහසු කාරණයක් නොවන අතර, මේ සියල්ලෙන් පසුවද සහනයක් බලාපොරොත්තු විය නොහැකිය.

# ලතින් ඇමෙරිකානු කලාපයේ වාමාංශික දේශපාලනය පිළිබඳ කියැවීමක්

**වර්ෂ දෙදහස් ගණන්වල ආරම්භයේ ලතින් ඇමෙරිකානු සහ කැරිබියානු කලාපයේ වාමාංශික ආණ්ඩුවල නැඟ ඒම 'රෝස රැල්ල' (Pink Tide) වශයෙන්ද හඳුන්වන ලදී. එය ආරම්භ වූයේ හියුගෝ චාවේස් වෙනිසියුලාවේ බලයට පත්වීමත් සමඟය. පසුව බොලීවියාවේ ඊවෝ මොරාලෙස්, බ්‍රසීලයේ ලූලා ද සිල්වා, ඉක්වදෝරයේ රෆායල් කොරයා මෙන්ම හොන්ඩුරාස්හි මැනුවෙල් සෙලායා ද බලයට පත්වූහ. 1959 සිට කියුබාව තුළ වාමාංශික ආණ්ඩුවක් පැවැති අතර බැටිස්ටාගේ පාලනයට එරෙහිව ෆිදෙල් කැස්ත්‍රෝගේ නායකත්වයෙන් ජයගත් විප්ලවයෙන් පසුකාලීනව අඛණ්ඩව වාමාංශික ආණ්ඩුවක් බලයේ රැඳී සිටියේය. කෙසේ නමුත්, පසුව නැවත දක්ෂිණාංශික සහ අතිදක්ෂිණාංශික ආණ්ඩුවල නැඟ ඒමත් සමඟ එකී වාමාංශික රැල්ල යටපත්වූ බවක් දක්නට ලැබිණි. නමුත්, වෙනිසියුලාවත්, නිකරගුවාවත්, කියුබාවත් වාමාංශික ආණ්ඩු පවත්වා ගැනීමට සමත් විය.**

පසුගිය සිව් වසර තුළ එකක් පසුපස එකක් වශයෙන් වාමාංශික පක්ෂ නැවත ලතින් ඇමෙරිකානු සහ කැරිබියානු කලාපයේ රටවල බලය තහවුරු කර ගනු ලැබීම නිරීක්ෂණය කළ හැකි වෙයි. මෙය 'නව රෝස රැල්ල' (New Pink Tide) වශයෙන් හැඳින්වීමද ආරම්භ වී තිබේ.

2022 වර්ෂයේ ජුනි මස ගුස්තාවෝ පේත්‍රෝ කොලොම්බියාවේ ජනාධිපති ධුරයට පත්විය. 2021 වාමාංශික ශිෂ්‍ය ක්‍රියාකාරිකයකුවූ ගේබ්‍රියල් බොරික් චිලියේ ජනාධිපති ලෙස පත්විය. 1971දී චිලියේ වාමාංශික සැල්වදෝර් අයියන්දේ ජනාධිපති ධුරයට පත්වූ නමුත්, වසරකට පමණ පසු හමුදා කුමන්ත්‍රණයක් මඟින් ඔහු බලයෙන් පහකරන ලදී. ඉන් පසු චිලියේ වාමාංශික ජනාධිපතිවරයකු පත්වූයේ වසර 50කට පසුවය. 2021 වර්ෂයේ අග හොන්ඩුරාස්හි ජනාධිපති ධුරයට ෂියොමාරා කැස්ත්‍රෝ පත්වූයේ වාමාංශික අපේක්ෂිකාවක් වශයෙනි. ඇය පත්වීමට පෙර ඇයගේ සැමියා වන මැනුවෙල් සෙලායා වාමාංශික ජනාධිපතිවරයකු වශයෙන් පත්ව සිටියද, වසර 12කට පෙර හමුදා කුමන්ත්‍රණයක් මඟින් ඔහුව බලයෙන් පහකරන ලදී. වාමාංශික ගුරුවරයකු සහ වෘත්තීය සංගම් නායකයකුවූ පෙද්‍රෝ කැස්ටිලෝ 2021 වර්ෂයේ පේරු රාජ්‍යයෙහි ජනාධිපති ධුරයට තේරී පත් විය. 2020 වර්ෂයේදී ලුවී ආසේ 'සමාජවාදය සඳහා ව්‍යාපාරය' යන පක්ෂයෙන් පත්විය. 2019 වර්ෂයේදී ඇල්බර්ටෝ ෆර්නැන්ඩස් ජනාධිපති ධුරයට පත්වූයේ වාමාංශික සන්ධානයක අපේක්ෂකයකු වශයෙනි. ඊට වසරකට පෙර අන්ද්‍රෙස් මැනුවෙල් ලෝපෙස් මෙක්සිකානු මහ මැතිවරණයෙන් අතිවිශාල ජයග්‍රහණයක් ලබාගන්නා ලදී. ඉතාම මෑතකදී ලබාගත් ජයග්‍රහණය වශයෙන් බ්‍රසීලයේ වාමාංශික ලූලා ද සිල්වා බ්‍රසීලයේ ජනාධිපති ධුරයට පත්වූයේ ලතින් ඇමෙරිකාවේ වඩාත්ම ඇමෙරිකානු ගැති අතිදක්ෂිණාංශික ජයිර් බොල්සනාරෝගේ පාලනයට තිත තබමිනි.

### නව වාමාංශික ආණ්ඩුවල දේශපාලන ප්‍රවාහයන්ගේ ස්වභාවය

රැල්ලක් වශයෙන් ලතින් ඇමෙරිකාව තුළ පත්වූ මෙම වාමාංශික ආණ්ඩු සියල්ල හෝ ජනාධිපතිවරුන් සියලු දෙනා සමාජවාදී හෝ කොමියුනිස්ට්වාදී දැක්මකින් දේශපාලන හෝ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ඇතැයි සිතිය නොහැකිය. එයට හේතුව මෙලෙස ආණ්ඩු ලෙස පත්වූ පක්ෂ සහ සන්ධාන අතර සමාජවාදී ව්‍යාපාර මෙන්ම සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සහ ප්‍රතිසංස්කරණවාදී දෘෂ්ටිවාද සහිත පක්ෂද පැවැතීමයි.

### පාලනයේ ස්වභාවය කෙසේ විය හැකිද?

ලතින් ඇමෙරිකානු සහ කැරිබියානු කලාපයේ ශක්තිමත් දළ දේශීය නිෂ්පාදිතයක් ඇති, වැඩි ජනගහනයක් සහ භූමි ප්‍රමාණයක් දරා සිටින රටවල් වන මෙක්සිකෝව, ආජන්ටිනාව, බ්‍රසීලය, චිලිය සහ කොලොම්බියාව ආදී රටවල් වාමාංශික ජනාධිපතිවරුන් පත්කර ගැනීම තුළ සහයෝගිතාව තුළින් ඔවුන්ගේ පාලනයන්හි ස්ථාවර බව ඇති කරගැනීමට ඉඩ විවෘතව ඇත. පසුගියදා බ්‍රසීලයේ සහ ආජන්ටිනාවේ ජනාධිපතිවරුන් විසින් නිවේදනය කරනු ලැබුවේ ඔවුන් ලතින් ඇමෙරිකානු කලාපයට පොදු මුදල් ඒකකයක් හඳුන්වා දීමට මූලිකත්වය ගැනීමට සූදානම් බවය. එසේම වාමාංශික පාලනය සහිත ආර්ථික ශක්තිය අඩු රටවලට යම් සුරක්ෂිතතාවක් සැලසීමටද මෙම රටවලට හැකිවනු ඇත.

කලාපය තුළ දීර්ඝ කාලයක් අධිරාජ්‍යවාදී මැදිහත්වීම්වලට විරුද්ධව සටන් කරමින් සිටින කියුබාවේ, වෙනිසියුලාවේ සහ නිකරගුවාවේ වාමාංශික

03 පිටුවට

| රට | වාමාංශික අපේක්ෂකයා | තේරී පත්වූ දිනය | පක්ෂය | ඡන්ද ප්‍රතිශතය |
|---|---|---|---|---|
| මෙක්සිකෝව | අන්ද්‍රෙස් මැනුවෙල් ලෝපෙස් ඔබ්‍රඩෝර් | 2018-12-01 | මොරෙනා (ජාතික පුනර්ජනන ව්‍යාපාරය) | 53% |
| ආජන්ටිනාව | ඇල්බර්ටෝ ෆර්නැන්ඩස් | 2019-12-10 | යුක්තිකාමීන්ගේ පක්ෂය | 48.1% |
| බ්‍රසීලය | ලූලා ද සිල්වා | 2023-01-01 | කම්කරු පක්ෂය | 48.43% |
| චිලිය | ගේබ්‍රියල් බොරික් | 2022-03-11 | සමාජ ඒකාග්‍රතාවය පක්ෂය | 55.87% |
| කොලොම්බියාව | ගුස්ටාවෝ පෙද්‍රෝ | 2022-08-07 | කොලොම්බියාව වෙනුවෙන් ඓතිහාසික එකමුතුව | 50.42% |
| පේරු | පෙද්‍රෝ කැස්ටිලෝ | 2021-07-19 | නිදහස් පේරු පක්ෂය | 50.13% |
| බොලීවියාව | ලුවී ආසේ | 2020-11-08 | සමාජවාදය උදෙසා ව්‍යාපාරය | 55.10% |
| හොන්ඩුරාස් | ෂියොමාරා කැස්ත්‍රෝ | 2022-01-27 | විමුක්තිය සහ ප්‍රතිස්ථාපනය | 51.12% |
| සුරිනාමය | චාන් සංතොකි | 2020-07-13 | ප්‍රගතිශීලී ප්‍රතිසංස්කරණවාදී පක්ෂය | 39.45% |
| පැනමාව | ලොරෙන්ටිනෝ කොටිසෝ | 2019-05-05 | ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවවාදී පක්ෂය | 33.35% |
| ගයානාව | ඉර්ෆාන් අලී | 2020-03-02 | ජනතා ප්‍රගතිශීලී පක්ෂය | 50.69% |

පාලනවල පන්නරයද නව රැල්ලේ වාමාංශික ආණ්ඩුවලට යම් මාර්ගෝපදේශයක් සපයනු ඇත.

තවද, අලුතින් පත්වූ වාමාංශික ආණ්ඩු පොදුවේ කලාපය තුළ ඇමෙරිකානු අධිරාජ්‍යවාදී බලපෑම ප්‍රතික්ෂේප කරන අතර කියුබාව සහ වෙනිසියුලාව සමඟ යහපත් සබඳතාවක් පවත්වා ගනිමින් සිටී. තවද, එක්සත් ජනපද ආයෝජන වෙනුවට චීන ආයෝජනවලට ඉඩ ලබාදෙන ප්‍රවණතාවක්ද පවතී. එසේම ඒ ඒ රටවලට අනන්‍යවූ කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානයකින් කටයුතු කරන බවද නිරීක්ෂණය කළ හැකි වෙයි. උදාහරණ වශයෙන් චිලියේ ගේබ්‍රියල් බොරික් විශේෂ අවධානයක් ව්‍යවස්ථා සංශෝධන, ස්වදේශික ජනතාවගේ අයිතිවාසිකම් කෙරෙහි යොමු කරන බව දක්නට ලැබෙයි. බ්‍රසීලය සලකන විට අවධානය බොහෝ දුරට පාරිසරික සංරක්ෂණය සහ මහජන සෞඛ්‍යය කෙරෙහි යොමු කරනු ඇත. එසේම ස්ත්‍රී - පුරුෂ සමානාත්මතාව සහ ස්ත්‍රී සහ ළමා සුරක්ෂිතතාව, සරණාගත ගැටලුව කෙරෙහි මෙක්සිකෝ ආදී රාජ්‍යයන්ගේ වාමාංශික ආණ්ඩුවලට සමීප අවධානයක් යොමු කිරීමට සිදු වනු ඇත. ඒ ඒ රටවල ජනතාවට වඩා සංවේදී ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කිරීම මෙකී වාමාංශික ආණ්ඩුවලට ජන ප්‍රසාදය පවත්වා ගැනීමට සහ වර්ධනය කරගැනීමට රුකුලක් වනු ඇත.

පසුගිය ජනවාරි 24 වනදා ආජන්ටිනාවේ බුවනෝස් අයර්ස්හිදී පැවති CELAC (Community of Latin American and Caribbean States) සමුළුවේදී ද මෙම කලාපයේ රටවල් 33හි නායකයන් හමුවූ අතර, කියුබාව සහ වෙනිසියුලාව මත ඇමෙරිකා එක්සත් ජනපදය පනවා ඇති සම්බාධක ඉවත් කළ යුතු බවට ඒකමතිකව එකඟ විය. බ්‍රසීලය නැවත වරක් සමුළුවට සහභාගී කරවීම සම්බන්ධයෙන් ජනාධිපති ලූලා ද සිල්වා වෙත සමුළුවේ ප්‍රසංශාවද පළකරන ලදී. වාමාංශික රටවල නායකත්වයන් අතර සහයෝගීතාව සමුළුව තුළ ඉස්මතුවූ කරුණක් විය.

2023 සහ 2024 වර්ෂ සලකන විට 2023 වර්ෂයේ පැරගුවේ, ගෝතමාලාව, ආජන්ටිනාව යන රටවල මහ මැතිවරණ පැවැත්වීමට නියමිතය. අර්බුදකාරී තත්ත්වය හමුවේ පේරු රාජ්‍යයෙහිද මහා මැතිවරණය කලින් පැවැත්වීමේ හැකියාව පවතී. එසේම 2024 වර්ෂයේදී මෙක්සිකෝ, පැනමා, එල් සැල්වදෝර්, පේරු සහ උරුගුවේ රාජ්‍යවල මහ මැතිවරණ පැවැත්වීමට නියමිතව පවතී. කලාපයේ බලවත් රටවල වාමාංශික නායකයන්ගේ පත්වීම සහ ඔවුන් අතර සහයෝගීතාව ඉස්මතුවීම තුළ එම රටවල වාමාංශික ප්‍රවාහ ශක්තිමත් වීමක්ද සිදුවනු ඇත.



### අභියෝග

කෙසේ නමුත්, මෙම බොහෝ රටවල තවමත් දක්ෂිණාංශික සහ ඇමෙරිකානු අධිරාජ්‍යවාදයට ගැති ප්‍රවාහ ශක්තිමත්ව පවතින අතර, නිරන්තරයෙන්ම වාමාංශික ආණ්ඩුවලට අභියෝග කරමින් තිබේ. ඉහත කී සමහර රටවල වාමාංශික නායකයන් බලයට පත්වූයේ දක්ෂිණාංශික හෝ අතිදක්ෂිණාංශික අපේක්ෂකයන් සමඟ පැවැති තීරණාත්මක තරගයකින් අනතුරුවයි. උදාහරණ වශයෙන් පේරු රාජ්‍යයේ ජනාධිපති වශයෙන් පෙද්‍රො කැස්ටිලො පත්වූයේ එරට අතිදක්ෂිණාංශික අපේක්ෂිකාවකවූ කෙයිකෝ ෆුජිමෝරි සමඟ පැවැති තීරණාත්මක තරගයකින් අනතුරුවයි.

කෙසේ නමුත්, පාර්ලිමේන්තුවේ වැඩි බලයක් කෙයිකෝ වෙත පැවැති අතර, පත්වූ අවස්ථාවේ පටන්ම කැස්ටිලෝ දෝෂාභියෝගයක් මඟින් බලයෙන් පහකිරීමට ප්‍රයත්න දරන ලදී. මෙකී ප්‍රයත්න සහ දක්ෂිණාංශික කණ්ඩායමේ පාක්ෂිකයන් විසින් රට තුළ ඇති කරන ලද කලබලකාරී තත්ත්වය විසින් පෙද්‍රො කැස්ටිලෝගේ ජනාධිපති ධුර කාලය 2021 ජුලි 28 වනදා සිට 2022 දෙසැම්බර් 07 වනදා තෙක් සීමා කිරීමට සමත් විය. මේ වනවිට පේරු රාජ්‍යයේ ජනාධිපති ධුරය දරන්නේ පෙද්‍රෝ කැස්ටිලෝගේ උප ජනාධිපතිවරියවූ ඔහුගේ පක්ෂයේ සමාජිකාවකව සිටි දැන් ස්වාධීන බවක් ප්‍රකාශයට පත් කර ඇති ඩීනා බොලුආර්තේ විසින් වන අතර, ඇයගේ ජනාධිපති ධුරයට විරුද්ධවද මේ වන විට කෝලාහල තත්ත්වයන් රට තුළ ඇතිවෙමින් පවතී. තවද, බ්‍රසීලයේ ජනාධිපති ධුරයට අති දක්ෂිණාංශික ජයිර් බොල්සනාරෝ පරාජය කරමින්, ලූලාද සිල්වා පත්වීමෙන් පසුව බ්‍රසීලය තුළද දැඩි කලහකාරීත්වයක් ඇති කරන ලද්දේ ජයිර් බොල්සනාරෝගේ පාක්ෂිකයන් විසිනි. ඒ අනුව පත්වී සිටින නව වාමාංශික ආණ්ඩුවලට සහ ජනාධිපතිවරුන්ට තවමත් ශක්තිමත්ව පවතින දක්ෂිණාංශික ප්‍රවාහවල කුමන්ත්‍රණ සහ ජනතා උසිගැන්වීම් අභියෝග වශයෙන් පවතී.


තවද කොවිඩ් 19 වසංගතයෙන් පසු ලතින් ඇමෙරිකානු කලාපයේ රටවල ආර්ථික අර්බුදයේ ස්වභාවය උච්චස්ථානයකට පත්විය. වාමාංශික ආණ්ඩුවල ජයග්‍රහණවලට ඒ ඒ රටවල පැවැති දක්ෂිණාංශික සහ අතිදක්ෂිණාංශික ආණ්ඩුවල අසමත්භාවයද, පොදු මහජනතාවගේ ඉල්ලීම් ඉටුකිරීමට සහ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට එකී දක්ෂිණාංශික ආණ්ඩු දැක්වූ අසමත්භාවයන්ද හේතු විය. ඒ අනුව පත්වූ වාමාංශික ආණ්ඩු කෙරෙහි ජනතාව දැඩි අපේක්ෂා තබා තිබේ. එබැවින්, පරාජයවූ දක්ෂිණාංශික බලවේගවල දුර්වලතා සහ අසමත්වීම් මඟහරවා ගනිමින්, ඒවා තම ආණ්ඩු තුළින්ද ප්‍රකාශයට පත්වීමට ඉඩ නොදෙමින් ජන ප්‍රසාදය ශක්තිමත්ව පවත්වා ගැනීමේ අභියෝගයද මෙම ආණ්ඩුවලට පවතී.

එක්සත් ජනපදය විසින්ද මෙම ආණ්ඩුවල නැඟ ඒම මේ ආකාරයෙන් පවත්වාගෙන යාමට ඉඩ දේ යැයි සිතිය නොහැකිය. ඇමෙරිකානු රාජ්‍ය ලේකම් ඇන්ටනි බ්ලින්කන් පසුගියදා දකුණු ඇමෙරිකාවේ සංචාරය කරමින්, කොලොම්බියාවේ, චිලියේ සහ පේරුහි වාමාංශික නායකත්වයන් හමුවී සාකච්ඡා පැවැත්වීය. හොන්ඩුරාස්හි ජනාධිපති ෂියොමාරා කැස්ත්‍රෝ දිවුරුම් දෙන අවස්ථාවට එක්සත් ජනපදයේ උප ජනාධිපතිනි කමලා හැරිස් සහභාගීවූ අතර, ෂියොමාරා කැස්ත්‍රෝ මුල්ම ද්විපාර්ශ්වික සාකච්ඡාව පැවැත්වූයේද ඇය

07 පිටුවට

## මානව ශිෂ්ටාචාරයේ විකාශනය (11 වැනි කොටස)

# අප්‍රිකානු ශිෂ්ටාචාර




### 1. හැඳින්වීම

**ලෝක සිතියමෙහි විශාල භූමිභාග යක් වන අප්‍රිකා මහාද්වීපය තුළ ශිෂ්ටාචාරයක් ගොඩනැගී නොතිබූ බව යුරෝපා ජාතික විද්වතුන්ගේ මතය විය. අප්‍රිකාව යුරෝපීය පාලනයෙන් මිදෙන තුරු අප්‍රිකාවේ ඉතිහාසය පිළිබඳ මෙම මතය ලෝකයේ බහුතරයක් විසින් පිළිග න්නා ලද අදහස බවට පත්ව තිබිණි. නමුත්, පසුව පුරාවිද්‍යාඥයන් විසින් සිදු කරනු ලැබූ පර්යේෂණ මගින් අප්‍රිකාවේ තිබූ ශිෂ්ටාචාරික සමාජය පිළිබඳ තොරතුරු අනාවරණය කර ගනු ලැබිණි. ශිෂ්ටාචාරයක ප්‍රධානතම ලක්ෂණයවූ නගර බිහිවී තිබීමට අදාළ සාක්ෂි ස්ථාන කිහිපයකින්ම සොයා ගැනීමට හැකි විය.**

මුහුදු මට්ටමේ සිට අඩි 16,000ක් තරම් උස කඳුවැටිද, ඒ මතින් නිර්මාණයවූ ගංගාවල් සහ විල් ගණනාවක්ද මෙම භූමිය තුළ නිර්මාණයවී තිබේ. ඇතැම් ස්ථානවල ලෝකයේ වැඩිම උෂ්ණත්වය පෙන්නුම් කරන අතර, තවත් ස්ථානයක සීතල ජලය මිදෙන තරම්ය. වාර්ෂික වර්ෂාපතනය අඟල් 156ක් පමණ ලැබෙන ප්‍රදේශ මෙන්ම වර්ෂය පුරා එක දිය බිඳුවක්වත් නොලැබෙන ප්‍රදේශද සහිත විවිධත්වයක් පවතී. නයිල් ගංගාව වැනි දීර්ඝ ගංගාද, සහරාව ආදී විශාල කාන්තාරද අයත් වන්නේ අප්‍රිකා භූමිභාගයටය. මෙම පරිසර විවිධතාව පදනම් කර ගනිමින්, අප්‍රිකාවේ ස්වාභාවික ශාක ව්‍යාප්තියද පුළුල් සංකීර්ණතාවක් පිළිබිඹු කරයි. නිවර්තන කලාපීය වැසි වනාන්තර, සැවානා තණබිම්, අර්ධ ශුෂ්ක තණබිම් ආදියෙන්ද සමන්විත වන මෙම භූමිය තුළ පැහැදිලි සෘතු වෙනස්කම්ද දක්නට හැකිය.

මානව කල්ප වානර විශේෂයකින් මිනිසා දක්වාවූ දීර්ඝකාලීන පරිණාම ක්‍රියාවලිය සිදුවන්නේද මෙම අප්‍රිකා කලාපය තුළය. 'ප්ලයිස්ටෝසීන' (Pleistocene) යුගයේ සිදුවූ මෙම පරිණාමීය ක්‍රියාවලියෙන් පසු 'හෝමෝ සේපියන්' (Homo sapiens) මානවයා මුළුමහත් පෘථිවි ගෝලය පුරා පැතිර ගිය බව අද වන විට වඩාත් විශ්වාසදායක මතයවී තිබේ. ප්ලයිස්ටෝසීන යුගයේ පැවැති සිසිල් දේශගුණික තත්ත්වය උණුසුම් වීමෙන් 'හොලෝසීන' (Holocene) යුගය උදා විය. එම කාලය තුළ ආදි මානවයා තම සංචාරක දිවිය ක්‍රමයෙන් අතහැර ස්ථිර ජනාවාස හරහා නාගරික ශිෂ්ටාචාරයක් දක්වා පරිවර්තනය වීම අප්‍රිකා මහාද්වීපයටද පොදු විය.

### 2. හොලෝසීන යුගයේ දඩකරුවෝ

#### 2.1. හොලෝසීන දඩකරු - අන්නගවේෂකයෝ

හොලෝසීන හූ අවධියේදී අප්‍රිකාවේ ජීවත්වූ දඩකරු - අන්නගවේෂී සංස්කෘතියේ ප්‍රධානතම ලක්ෂණය වන්නේ ඊට පෙර යුගවලදී නිෂ්පාදනය කරන ලද විශාල ප්‍රමාණයේ ගල් මෙවලම් වෙනුවට කුඩා ප්‍රමාණයේ කාර්යක්ෂම ගල් මෙවලම් භාවිතයට යොමුවීමයි. මේවා ක්ෂුද්‍ර ශිලා මෙවලම් ලෙස හැඳින්වේ. හොලෝසීන මුල් කාලයේ ජීවත්වූ අප්‍රිකානු දඩයක්කරුවන් විසින් දුන්න සහ ඊතලය භාවිත කර තිබේ. ඊතල හිස් තනා ඇත්තේ, ගල්වලිනි. වසර 30,000ක් පමණ පැරණි ක්ෂුද්‍ර ශිලා මෙවලම් කොංගෝ රාජ්‍යයට අයත් 'මටුපි' ගල්ගුහාවෙන් සොයාගෙන තිබේ. හොලෝසීන යුගය ආරම්භයේදී එනම්, වසර 11,000කට මෙපිට කාලයේ වර්ධනයවී ඇති ක්ෂුද්‍ර ශිලා මෙවලම් දියුණුවීම ආරම්භවී ඇත්තේ, ඊට විශාල කාලයකට පෙර බව මෙමගින් සනාථ වෙයි.

අප්‍රිකාවේ ක්ෂුද්‍ර මෙවලම් ඉතා හොඳින් පෙන්නුම් කරන්නේ 'විල්ටන් කර්මාන්තය' (Wilton Industry) යනුවෙන් හඳුන්වන මෙවලම් ශෛලිය මගිනි. මෙම ශෛලි සම්ප්‍රදායය ක්‍රිස්තු පූර්ව 6000දී පමණ ආරම්භ විය. ඊට පෙර පැවැති 'ඕක්හර්ස්ට්' (Oakhurst) ශිලා කර්මාන්තය විශාල ප්‍රමාණයේ අස්ථි මෙවලම්වලින් සමන්විත වේ. එහි ක්ෂුද්‍ර ශිලා මෙවලම් දක්නට නැත. මෙය ක්‍රිස්තු පූර්ව 10000 සිට ක්‍රිස්තු පූර්ව 6000 දක්වා පැවැතිණි. මෙම කර්මාන්ත දෙක ආරම්භ කළ හොලෝසීන දඩකරු - අන්නග වේෂකයන්ගෙන් පැවත එන ගෝත්‍රික කණ්ඩායම් අදත් අප්‍රිකාවේ ජීවත් වෙති. ඔවුන් අප්‍රිකාවේ 'කොහ්යිසාන්' (Khoisan) භාෂා පවුලට අයත්ය. දකුණු සිම්බාබ්වේ පිහිටි මෙල්ක්හවුම් වියළි ගල්ගුහාවද මෙම යුගයට සාක්ෂි සපයයි.

පුරාවිද්‍යාත්මක සාක්ෂිවලට අමතරව අප්‍රිකාවේ දැනට ජීවත්වන 'කුන්ග්සාන් බුෂ්මන්' (Kung San Bushmen) නමින් හැඳින්වෙන ගෝත්‍රය තුළ අද දක්වා දක්නට



ඉතියෝපියාවේ 'අක්සුම්' සන්ප්‍රදායෝ

ලැබෙන ලක්ෂණ අධ්‍යයනය කිරීමෙන් තහවුරුවී ඇත්තේ, ඔවුන් වසර දහස් ගණනකට පෙර අප්‍රිකාවේ ජීවත්වූ ප්‍රාග් ඓතිහාසික දඩකරු - අන්නගවේෂකයන්ගෙන් පැවත එන බවයි. තවමත් ඔවුහු දඩයමින් සහ ආහාර එකතු කිරීමෙන් තම ජීවිත පවත්වාගෙන යති.

#### 2.2. ස්ථිරවාසීතාවේ මුල් සලකුණු

හොලෝසීන යුගය ආරම්භ වීමට සැලැකිය යුතු කාලයක සිට නයිල් නිම්නයේ ජීවත්වූ දඩකරු - අන්නගවේෂකයෝ ස්ථිරවාසීතාවට පත්වීමේ මූලික ලක්ෂණ පෙන්නුම් කළහ. දකුණු ඊජිප්තුවට අයත් 'අස්වාන්' ප්‍රදේශයේ පිහිටි 'වාඩි කුබ්බානියා' (Wadi Kubbaniya) නම් ස්ථානයෙන් ස්ථිරවාසීතාවේ ආරම්භය පිළිබඳ සාධක සොයාගෙන තිබේ. තවත් සංස්කෘතිකමය වශයෙන් ඉදිරි කටයුත්තක් වූයේ මළවුන් භූමදානය කිරීමයි. 'ක්වඩාන්' (Qadan) ප්‍රදේශයට අයත් 'ජෙබෙල් සහබා' (Jebel Sahaba) නම් ස්ථානයෙන් සොහොන් බිමක් සොයාගෙන තිබේ. නයිල් ගංගාවේ පහළ කොටසට අයත් ප්‍රදේශයේ පිහිටි

'බාර්ටොම් කම්ස්තානයෙන්' ක්ෂුද්‍ර ශිලා මෙවලම් සමග ආදිකාලීන වළං වර්ගවලට අදාළ සාක්ෂි ද සොයාගෙන තිබේ. තවද, එම ස්ථානයේ වරිච්චිවලින් ඉදි කරන ලද නිවාසවල සාධක සොයාගැනීමෙන් ද, 'ඔකල්හ්' ක්ෂේම භූමියෙන් ගලින් තැනූ නිවාස පිළිබඳ සාක්ෂි සොයාගැනීමෙන් ද මෙම තත්ත්වය සනාථ වී තිබේ.

### 2.3. කෘෂිකර්මය ආරම්භ වීම

නැගෙනහිර සහරා ප්‍රදේශයෙන් හමුවන සාධකවලට අනුව අප්‍රිකාවේ පැරණිතම කෘෂිකාර්මික කටයුතු පිළිබිඹු වන්නේ සතුන් ගෘහාශ්‍රිත කිරීමෙනි. ක්‍රිස්තු පූර්ව 5000දී සහරා ප්‍රදේශයේ විසූ ජනයා විසින් එළුවන් සහ බැටළුවන් ඇති කරනු ලැබීය. මොවුන් අප්‍රිකාවට ලැබුණේ බටහිර ආසියා කලාපයෙනි. එකල ආහාරයට ගත් ධාන්‍ය අතර ප්‍රධාන වූයේ කුරක්කන් ය. නයිල් ගංගාවේ පිටාර නිම්නයේ 'මෙරිම්දේ' (**Merimde**) නම් ස්ථානයෙන් සොයා ගත් සාක්ෂි අනුව බාර්ලි සහ 'එමර්' නමින් හැඳින්වෙන තිරිඟු වර්ගය ද විය. ඉන්දියාවෙන් සොයාගෙන තිබෙන සාක්ෂි අනුව අප්‍රිකාවේදී සෝගම් ගෘහාශ්‍රිත කරන්නට ඇත්තේ, ක්‍රිස්තු පූර්ව 3000දී පමණ විය හැකි බවට අනුමාන කෙරේ. බටහිර අප්‍රිකාවේ 'ජෙනෙ ජෙනො' (Jenne-Jeno) නම් ස්ථානයේ ක්‍රිස්තු පූර්ව 1000දී ගෘහාශ්‍රිත කරන ලද අප්‍රිකාවට ආවේණික වී වර්ගයක් පිළිබඳව ද සොයාගෙන තිබේ.

### 2.4. ලෝහ භාවිතය ආරම්භ කිරීම

ඊජිප්තුව හැරුණුවිට නයිල් නිම්නයට අයත් සුඩානය, මෞරිටානියාව සහ නයිගර් යන ප්‍රදේශවල පළමුවරට යකඩ ලෝහ භාවිතය ආරම්භ වී ඇති බවට සාක්ෂි තිබේ. එය ස්වදේශික වශයෙන් අප්‍රිකාව තුළම සිදුවූවා ද නැතහොත්, අප්‍රිකාවට පිටතින් ලැබුණු තාක්ෂණයක් ද යන්න තවමත් විවාද සහිතව පවතී. නයිගර්හි 'දෝ දිම්' සහ නයිජීරියාවේ 'තරුගා' යන ස්ථානවල ක්‍රිස්තු පූර්ව 1000දී යකඩ උණු කරනු ලැබ තිබේ. එය කෘෂිකර්මාන්තයේ දියුණුවට විශාල පිටිවහලක් විය.

## 3. අප්‍රිකාවේ නගර බිහි වීම

අප්‍රිකානු මහාද්වීපයේ ශිෂ්ටාචාරික ලක්ෂණ පෙන්වන නාගරික මධ්‍යස්ථාන බිහි වීමට බලපෑ සාධක කිහිපයක් තිබේ. ක්‍රිස්තු පූර්ව 1000 වන විට සංචාරක දඩකරු - අන්නගවේෂකයන් මුළුමනින්ම පාහේ ස්ථිරවාසීතාවට පත්ව සිටීම. ලෝහ භාවිතය මඟින් කෘෂිකර්මයේ ඇතිවූ වර්ධනයත් සමග ආහාර අතිරික්තයක් ඇති වීම මෙන්ම උතුරින් පිහිටි ඊජිප්තු ශිෂ්ටාචාරයේ බලපෑම ද මේ සඳහා විශාල පිටිවහලක් විය. අප්‍රිකාවේ මුල් නගර බිහි වීම නයිල් නිම්නයට අයත් විවිධ පළාත්වල සිදු විය. එම ක්‍රියාවලිය තේරුම් ගැනීමේ පහසුවට ගංගාව කොටස් හයකට බෙදනු ලැබ තිබේ. ඒවා හඳුන්වන්නේ නොගැඹුරු ගංගා පතුල (Cataracts) නමිනි. පැරණිතම නගර බිහි වන්නේ 'දෙවැනි දිය බෙදුම' නමින් හැඳින්වෙන කලාපය තුළ ය.

### 3.1. නූබියන් නාගරිකකරණය

අප්‍රිකාවේ මුල්ම නාගරික ලක්ෂණ බිහි වන්නේ නයිල් නිම්නයේ මධ්‍ය කොටසේ ය. එම ප්‍රදේශයේ ජීවත්වූ නූබියන්වරු මෙම ශිෂ්ටාචාරය ගොඩනැඟීමට මුල් වූහ. අවස්ථා දෙකකදී (ක්‍රි.පූ. 1975-1640 සහ ක්‍රි.පූ. 1540 - 1075) මෙම ප්‍රජාව ඊජිප්තු පාරාවරුන්ගේ බලපෑමට ලක් විය. මෙම ප්‍රදේශයේ බලකොටු ගණනාවක් ඉදි කර තිබෙන අතර, 'බුහෙන්' (**Buhen**) නමැති ස්ථානයේ පිහිටි බලකොටුව ප්‍රධාන තැනක් ගනී. එය ඇතුළත කුඩා නගරයක් ද තිබේ. එහි නාගරිකයන්ගේ නිවාස, හමුදා නිවස්න, කර්මාන්තකරුවන්ගේ වැඩපළවල්, ප්‍රධාන පාලකයාගේ මාලිගය, දේවස්ථාන ආදිය මඟින් පෙන්නුම් කෙරෙන්නේ එය නාගරික ජනාවාසයක් බවයි. ක්‍රිස්තු පූර්ව 1500න් පසු කාලයේ නූබියාව කේන්ද්‍ර කර බිහිවූ ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ 'කේර්මා' (Kerma) නගරයයි. එය නගරයක් පමණක් නොව දේශගුණික මධ්‍යස්ථානයක් ද විය. නයිල් ගංගාවේ දකුණු ඉවුරේ 'ඩොන්ගෝලා' (Dongola) ප්‍රදේශයේ මෙය පිහිටා තිබේ.

ක්‍රිස්තු පූර්ව 900දී පමණ මධ්‍ය නයිල් නිම්නයට අයත් තවත් නාගරික මධ්‍යස්ථානයක් වූයේ 'නප්තා' (**Naphtha**) ය. එය ද සරුසාර ඩොන්ගෝලා ප්‍රදේශයටම අයත් ය. එය 'කුෂ් රාජධානිය' (**Kingdom of Kush**) නමින් හැඳින්වේ. කේර්මා නගරයට දකුණින් 'මෙරෝ' (Meroë) නම් ස්ථානය ද තවත් නාගරික මධ්‍යස්ථානයක් විය. මෙය මෙරොයිටික රාජ්‍යයේ කේන්ද්‍රස්ථානයයි.

### 3.2. අක්සුම් ශිෂ්ටාචාරය

ඊසානදිග අප්‍රිකාවේ වර්තමාන ඉතියෝපියාව සහ එරිත්‍රියාව යන ප්‍රදේශවල නාගරික ශිෂ්ටාචාරික ලක්ෂණ ඇතුළත් අක්සුම් (Aksum) නගරය කේන්ද්‍ර කොටගෙන මෙම ශිෂ්ටාචාරය පැතිර ගොස් තිබේ. පූර්ව අක්සුම් අවධිය (ක්‍රි.පූ. 500 - ක්‍රි.ව. 100) සහ අක්සුම් අවධිය (ක්‍රි.ව. 100 - ක්‍රි.ව. 1000) ලෙස මෙය කාලවකවානු දෙකකට බෙදා අධ්‍යයනය කරනු ලැබේ.

### 3.3. බටහිර අප්‍රිකානු නගර

බටහිර අප්‍රිකාවේ මාලි ප්‍රදේශය තුළින් ක්‍රිස්තු වර්ෂ 100ට අයත් නාගරික සංස්කෘතියකට අදාළ සාධක හමුවී තිබේ. ජෙනෙ - ජෙනො නම් ස්ථානයෙන් මෙම සාධක හමුවී ඇති අතර, ඒ සඳහා පසුබිම සකසා ඇත්තේ, නයිගර් නිම්නයයි.

### 3.4. සිම්බාබ්වේ නගර

අප්‍රිකාවේ දකුණු කොටසේ රට අභ්‍යන්තරය තුළ සිම්බාබ්වේ සානුවට අයත් ප්‍රදේශ තුළ ක්‍රිස්තු වර්ෂ 1000-1500 අතර කාලය තුළ ශිෂ්ටාචාරික ලක්ෂණ වර්ධනය විය. විශාල පරිමාණයේ ඉදිකිරීම් දක්නට තිබෙන අතර, විශාල බලකොටුවක් ද ඉදි කර තිබේ.

### 3.5. නැගෙනහිර අප්‍රිකාවේ පුරාණ නගර

වර්තමාන ටැන්සානියාවට අයත් පැරණි 'කිල්වා කිසිවානි' (Kilwa Kisiwani) ඇතුළු නගර කිහිපයක් අප්‍රිකාවේ නැගෙනහිර වෙරළ දිගට වර්ධනය වී තිබිණි. සාක්ෂරතාවක් හිමි ප්‍රජාවක් ජීවත්වූ එම නගර ඉස්ලාමික වෙළෙඳ මධ්‍යස්ථාන ලෙස ක්‍රියාත්මකව පැවැතිණි. මෙම නාගරික සභ්‍යත්වය 'ස්වාහිලි' සංස්කෘතිය (Swahili culture) ලෙස හඳුන්වනු ලැබේ. ඔවුන්ගේ භාෂාව 'කී-ස්වාහිලි' නම් විය. එය 'බන්ටු' (Bantu) නම් භාෂාවෙන් බිඳී ආ එකකි. ක්‍රිස්තු වර්ෂ 1500 වන විට එය උපරිම දියුණු තත්ත්වයකට පත් වී තිබිණි. පෘතුගීසි ජාතීන් නැගෙනහිර අප්‍රිකාවට ගොඩබසින ලද්දේ මෙම වකවානුවේ ය.

පුළුල් භූගෝලීය සහ දේශගුණික වෙනස්කම් ගණනාවක් ඇතුළත් විවිධත්වයක් එකම මහාද්වීපික ගොඩබිමක් මත තිබෙන තත්ත්වයක් තුළ ඒ ඒ ලක්ෂණවලට අනුරූපව ශිෂ්ටාචාරික සමාජය නිර්මාණය කර ගැනීමට මිනිසාගේ සමත්කම දැක්වීමට හොඳම නිදසුනක් වනුයේ අප්‍රිකානු ශිෂ්ටාචාරයයි.



් විශාල කුළුණක්



'කුෂ්' හි පුරාණ දේවාලයක නටඹුන්

# ත්‍රස්ත විරෝධී පනත කා සඳහාද?
# (Anti - Terrrorism Act)

**ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් 2023 මාර්තු 17 වැනිදා 'ත්‍රස්ත විරෝධී' පනත් කෙටුම්පත ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත්කරන ලදී. මෙය ගෙන එනු ලබන්නේ 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට ජාතිකව සහ ජාත්‍යන්තරව එල්ලවූ විවේචන නිසා බවද ප්‍රකාශයට පත්විය.**



මෙම පනත් කෙටුම්පතේ 'ත්‍රස්තවාදී වරදක්' යන්නට දී ඇති අර්ථනිරූපණය ඕනෑම පැත්තකට හරවාගත හැකි කබරගොයා තලගොයා කරගත හැකි අන්දමේ එකකි.

කෙටුම්පතේ 'ත්‍රස්තවාදය පිළිබඳ වැරැදි' සඳහන් කර ඇත්තේ 3(2) වගන්තියේය. ඒ අනුව ත්‍රස්තවාදී ක්‍රියා ලෙස හඳුන්වන වැරැදි වර්ග 13ක් හඳුන්වාදී තිබේ. ඒ අතර ඇති පහත වගන්තිවලින් ආණ්ඩුවේ සැබෑ අරමුණ හෙළිකරගත හැකිය.

- යම් මහජන භාවිත ස්ථානයකට, රාජ්‍ය හෝ ආණ්ඩුවේ පහසුකමකට, යම් පොදු හෝ පෞද්ගලික ප්‍රවාහන පද්ධතියකට හෝ යම් යටිතල පහසුකමකට හෝ පරිසරයට බරපතළ අලාභහානි සිදු කිරීම.

- යම් අත්‍යවශ්‍ය සේවාවකට හෝ සැපයීම්වලට හෝ යම් අත්‍යවශ්‍ය සේවා හෝ සැපයීම් සමඟ සම්බන්ධ යම් තීරණාත්මක යටිතල පහසුකමකට හෝ ප්‍රවාහන පහසුකමකට බරපතළ බාධා ඇති කිරීම හෝ අලාභහානි කිරීම හෝ ඒ සඳහා මැදිහත්වීම.

- රාජ්‍ය හෝ පෞද්ගලික දේපළ සම්බන්ධයෙන් කොල්ලකෑමේ, ත්‍රාසද්ග්‍රහණය කිරීමේ හෝ සොරකම් කිරීමේ වරද සිදු කිරීම.

- මහජනතාවගේ හෝ එහි යම් කොටසක සෞඛ්‍යයට සහ ආරක්ෂාවට බරපතළ අවදානමක් ඇති කිරීම.

- ශ්‍රී ලංකාවට පවරා දී ඇති යම් ඉලෙක්ට්‍රොනික හෝ ස්වයංක්‍රීය පරිගණක පද්ධතියකට හෝ ජාලයකට හෝ සයිබර් අවකාශයකට හෝ එවැනි බලවර්තනයකට හෝ එවැනි බලවර්තනයක ලියාපදිංචිවී සිටින වෙබ් අඩවිවලට බරපතළ බාධා ඇති කිරීම හෝ අලාභහානි සිදු කිරීම හෝ එවැන්නකට මැදිහත්වීම.

(අ) ඡේදයේ සිට (ඔ) ඡේදය දක්වා වන ඡේදවල දක්වා ඇති යම් ක්‍රියාවක් හෝ නීති විරෝධී නොකර හැරීමක් සිදුකිරීම සඳහා වන අයුතු ජන රාශියක සාමාජිකයකු වීම; හෝ .... යනාදී වශයෙන් සඳහන්ය.

මෙහි සඳහන් කර ඇත්තේ, රජයේ ආයතනවල ක්‍රියාවලීන් සම්බන්ධවය. ඒ අනුව පැහැදිලිවම වෘත්තීය සමිති, ගොවි, ශිෂ්‍ය ආදී ජනතා ක්‍රියාකාරීත්වයන් මර්දනය කිරීමට බව පැහැදිලිය.

මෙම පනත් කෙටුම්පතේ 10 වැනි වගන්තියද ඉතාම බරපතළ බව පෙනේ. එහි දැක්වෙන්නේ ත්‍රස්තවාදය දිරිගැන්වීම සඳහා;

01. මුද්‍රිත මාධ්‍ය

02. අන්තර්ජාලය

03. ඉලෙක්ට්‍රොනික මාධ්‍ය

04. වෙනත් ආකාරයක ප්‍රසිද්ධ දැන්වීමක්

යන මාධ්‍ය භාවිත කරමින් "ජනතාවගෙන් ඇතැමෙක් විසින් හෝ සියලුම ජනතාව විසින් ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට, ඒ සඳහා සූදානම් වීමට හෝ පෙළඹවීමට ඔවුන් සෘජුව හෝ වක්‍රව දිරිගන්වන්නක් හෝ පොළඹවන්නක් ලෙස තේරුම් ගැනීමට ඉඩ ඇති යම් ප්‍රකාශයක් පළ කරන්නාවූ හෝ පළ කිරීමට කටයුතු සලස්වන්නාවූ හෝ එවැනි වචනයක් හෝ වචන කතා කරන්නාවූ හෝ සංඥා හෝ දෘශ්‍ය නිරූපණය සිදු කරන්නාවූ" තැනැත්තකු ත්‍රස්තවාදී වරදක් සිදුකරන්නකු බවය.

මෙම වගන්තිය ඔස්සේ ඕනෑම ප්‍රසිද්ධ ජනමාධ්‍යයකින්, දැන්වීමකින් හෝ ෆේස්බුක් වැනි සමාජ මාධ්‍ය වේදිකාවකින් යමෙකු ප්‍රකාශ කරන කාරණයක් 'ත්‍රස්තවාදය දිරිගැන්වීමක්' ලෙස සලකා දඬුවමට යටත් කළ හැකිය.

පනත් කෙටුම්පතේ 16වැනි වගන්තියද ප්‍රශ්නසහගතය. ඒ අනුව ප්‍රදේශයකට ඇතුළත් වීම, යම් මාර්ගයක ගමන් කිරීම තහනම් කිරීම පවා කිරීමට පොලිස් නිලධාරියකුට හැකියාව පවතින අතර, එම නියෝග නොපිළිපදින්නේ නම් ත්‍රස්තවාදියකු ලෙස අත්අඩංගුවට ගැනීමට හැකිය.

එසේම 83වැනි වගන්තියේ දක්වා ඇත්තේ, මහාධිකරණය හමුවට ගොස් පුද්ගලයන්ට විරුද්ධව නියෝග ලබාගැනීමට ජනාධිපතිවරයාට ලබාදෙන බලයයි. ඒ අනුව යම් පුද්ගලයකු ත්‍රස්තවාදයට සම්බන්ධ වරදක් සිදුකර ඇති බවට චෝදනා ලැබුවහොත්, අධිකරණයෙන් අවසර ලබාගෙන, ජනාධිපතිවරයාට අදාළ පුද්ගලයා සම්බන්ධයෙන් සීමාවන් පැනවීමේ හැකියාව මෙම පනත ඔස්සේ ලබාදී ඇත. (දැනට පවතින නිතිය යටතේ එවැනි සීමාකිරීම් වෙනුවෙන් අවසර ලබාගත හැක්කේ පොලිසියට හෝ නීතිපතිවරයාට පමණකි).

එසේම පනතේ 82වැනි වගන්තිය යටතේ ත්‍රස්තවාදී වරදක් සිදුකරන බවට චෝදනා එල්ල කෙරෙන ඕනෑම 'සංවිධානයක්' තහනම් කිරීමේ බලයද ජනාධිපතිවරයාට පවරා ඇත. පොලිස්පතිවරයා ලබාදෙන නිර්දේශයක් මත පවා ජනාධිපතිවරයාට චෝදනා ලබන ඕනෑම සංවිධානයක් තහනම් කළ හැකිය.

මෙහි බොහෝ වැරැදි සඳහා වසර 20ක් නොඉක්මවන කාලයකට බරපතළ වැඩ සහිතව බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ 10ක දඩයකට යටත් කිරීමේ හැකියාව මහාධිකරණයට ලබාදී ඇත.

කෙසේ නමුත්, 2023 අප්‍රේල් මස මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කරගන්නා බව අධිකරණ ඇමැතිවරයා ප්‍රකාශ කළද, මතුව ඇති විරෝධතා හේතුවෙන් එය කල් දමා ඇත.

## ලතින් ඇමෙරිකානු කලාපයේ වාමාංශික .........

02 - 03 පිටුවෙන්

සමගයි.

මෙක්සිකෝවේ ජනාධිපති සලකන විට ඔහුද ලතින් ඇමෙරිකානු වාමාංශික ආණ්ඩු සමග මිත්‍රශීලිව කටයුතු කරන අතර, එක්සත් ජනපදය සමගද සමීප සබඳතාවක් පවත්වා ගනිමින් සිටී. මේ අනුව ඇමෙරිකා එක්සත් ජනපදයේ බලපෑම් කලාපය තුළට එදිරිවාදී ස්වරූපවලින් මෙන්ම මිත්‍රශීලී ස්වරූපයෙන්ද ඇතුළු විය හැකි බව නිරීක්ෂණය කළ හැකිය.

### නිගමනය

මේ වන විට ලතින් ඇමෙරිකානු සහ කැරිබියානු කලාපයේ බ්‍රසීලය, මෙක්සිකෝව, ආජන්ටිනාව, චිලිය ආදී ශක්තිමත් රාජ්‍යවල නායකත්වයට වාමාංශික නායකයෝ පත්ව ඇත. ඊට අමතරව කියුබාව, වෙනිසියුලාව සහ නිකරගුවාව අභියෝග සහ සම්බාධක මැද වාමාංශික ආණ්ඩු පවත්වාගෙන යයි. පසුගිය වසර දෙක තුන තුළ තවත් රටවල් කිහිපයකම නායකත්වයට වාමාංශික දේශපාලන ප්‍රවාහ පත්විය. මෙම නායකත්වයන් වාමාංශික වශයෙන් පොදුවේ හැඳින්වුවද, ඔවුන් අතර සමාජවාදී, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සහ ප්‍රතිසංස්කරණවාදී ආදී වශයෙන් දෘෂ්ටිවාදී වෙනස්කම් නිරීක්ෂණය කළ හැකිවෙයි. අධිරාජ්‍යවාදී සහ දක්ෂිණාංශික කුමන්ත්‍රණවල ඉලක්ක බවටද මෙම වාමාංශික ආණ්ඩු මේ වන විට පත්ව තිබේ. කෙසේ නමුත්, බොලීවියාව, චිලිය සහ බ්‍රසීලය යන රටවල ජනතාව නැවත වරක් වාමාංශික නායකයන් කෙරෙහි විශ්වාසය තැබීම තුළ අපට පසක් වන කාරණය වන්නේ අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණ කුමන ආකාරයෙන් ක්‍රියාත්මක වුවද, ඇමෙරිකාව ප්‍රමුඛ අධිරාජ්‍යවාදී අතපෙවීම්වලට සහ බලපෑම්වලට එරෙහිව වාමාංශික දේශපාලන ප්‍රවාහය කෙරෙහි ලතින් ඇමෙරිකානු ජනතාවගෙන් බහුතරයකගේ ඇති ප්‍රසාදයයි. එසේම දක්ෂිණාංශික පාලකයන් අර්බුදය හමුවේ අසමත් වීම තුළ වාමාංශික දේශපාලන ව්‍යාපාර මත ජනතාව විශ්වාසය තබමින් සිටින බවයි. අවස්ථාවාදයට සහ අධිරාජ්‍යවාදී උගුල්වලට ගොදුරු නොවී රටවල් අතර සහයෝගීතාව පවත්වාගෙන යන්නේ නම්, ලතින් ඇමෙරිකාවේ දැනට පාලනයේ සිටින වාමාංශික ආණ්ඩුවලට ශක්තිමත්ව පැවැතීමට මෙන්ම කලාපයේ ආනෙකුත් රටවල වාමාංශික පාලන ඇති වීම දිරිගැන්වීමටද හැකිවනු ඇත. එසේම ඇමෙරිකාව ප්‍රමුඛ අධිරාජ්‍යවාදී කඳවුරට එරෙහි ජාත්‍යන්තර සටන් පෙරමුණට ශක්තියක් සැපයීමටද ලතින් ඇමෙරිකානු සහ කැරිබියානු කලාපයේ වාමාංශික ප්‍රවාහයට වනු ඇත.

ලතින් ඇමෙරිකානු සහ කැරිබියානු කලාපය තුළ රටවල් 33 ක් පවතී. එකී රටවල් වල ජනගහණය, භූමි ප්‍රමාණය සහ දළ දේශීය නිෂ්පාදිතය ආසන්න වශයෙන් පහත ආකාර වේ. මෙම රටවල් වලට අමතරව වෙනත් රටවල් වලට පරායත්ත වූ පාලන කලාප 15 ක් පමණ වෙයි.

| රට | ජනගහනය (2020) | කලාපයේ සමස්ත ජනගහනය සලකන විට ප්‍රතිශතය | භූමි ප්‍රමාණය (වර්ග කි.මී.) | කලාපයේ සමස්ත භූමි ප්‍රමාණය සලකන විට ප්‍රතිශතය | දළ දේශීය නිෂ්පාදිතය (ඇමෙරිකානු ඩොලර් බිලියන 2021 වර්ෂය) |
|---|---|---|---|---|---|
| බ්‍රසීලය | 212,559,417 | 32.73% | 8,515,770 | 41.664% | 1,608.08 |
| මෙක්සිකෝව | 128,932,753 | 19.85% | 1,964,375 | 9.611% | 1,297.66 |
| ආජන්ටිනාව | 45,195,774 | 6.96% | 2,780,400 | 13.603% | 486.7 |
| චිලිය | 19,116,201 | 2.94% | 756,102 | 3.699% | 316.77 |
| කොලොම්බියාව | 50,882,891 | 7.84% | 1,138,910 | 5.572% | 314.41 |
| පේරු | 32,971,854 | 5.08% | 1,285,216 | 6.288% | 225.94 |
| කියුබාව | 11,326,616 | 1.74% | 110,860 | 0.542% | 107.4 (2020තුළ) |
| ඉක්වදෝරය | 17,643,054 | 2.72% | 283,561 | 1.387% | 106.17 |
| ඩොමිනිකන් ජනරජය | 10,874,910 | 1.67% | 48,670 | 0.238% | 94.71 |
| ගෝතමාලාව | 17,915,568 | 2.76% | 108,889 | 0.533% | 85.97 |
| කෝස්ටාරිකාව | 5,094,118 | 0.78% | 51,100 | 0.250% | 64.42 |
| පැනමාව | 4,314,767 | 0.66% | 75,420 | 0.369% | 63.61 |
| වෙනිසියුලාව | 28,435,940 | 4.38% | 912,050 | 4.462% | 59.51 |
| උරුගුවේ | 3,473,730 | 0.53% | 176,215 | 0.862% | 59.29 |
| බොලීවියාව | 11,673,021 | 1.80% | 1,098,581 | 5.375% | 40.7 |
| පැරගුවේ | 7,132,538 | 1.10% | 406,752 | 1.990% | 38.82 |
| එල් සැල්වදෝරය | 6,486,205 | 1.00% | 21,041 | 0.103% | 28.74 |
| හොන්ඩුරාස් | 9,904,607 | 1.53% | 112,090 | 0.548% | 28.49 |
| ට්‍රිනිඩෑඩ් සහ ටුබැගෝ | 1,399,488 | 0.22% | 5,128 | 0.025% | 23.99 |
| හයිටි | 11,402,528 | 1.76% | 27,750 | 0.136% | 21.02 |
| ජැමෙයිකාව | 2,961,167 | 0.46% | 10,991 | 0.054% | 15.39 |
| නිකරගුවාව | 6,624,554 | 1.02% | 130,370 | 0.638% | 14 |
| බහමාස් | 393,244 | 0.06% | 13,880 | 0.068% | 11.21 |
| ගයනා | 786,552 | 0.12% | 214,969 | 1.052% | 7.72 |
| බාබඩෝස් | 287,375 | 0.04% | 430 | 0.002% | 4.85 |
| සුරිනාමය | 586,632 | 0.09% | 163,821 | 0.802% | 2.85 |
| බෙලිස් | 397,628 | 0.06% | 22,966 | 0.112% | 2.43 |
| සෙන්ට් ලුසියා | 183,627 | 0.03% | 617 | 0.003% | 1.69 |
| ඇන්ටිගුවා සහ බාර්බුඩා | 97,929 | 0.02% | 440 | 0.002% | 1.47 |
| ග්‍රෙනාඩා | 112,523 | 0.02% | 344 | 0.002% | 1.12 |
| සෙන්ට් කිට්ස් සහ නෙවිස් | 53,199 | 0.01% | 261 | 0.001% | 0.95 |
| සෙන්ට් වින්සන්ට් සහ ග්‍රෙනඩීන්ස් | 110,940 | 0.02% | 389 | 0.002% | 0.88 |
| ඩොමිනිකා | 71,986 | 0.01% | 750 | 0.004% | 0.54 |

# නිර්ධන පන්ති දේශපාලන පක්ෂය

**රාජ්‍ය බලය අරමුණු කර ගත් සංවිධාන පොදුවේ දේශපාලන පක්ෂ ලෙස හඳුන්වනු ලබන අතර, මෙහි දී අප විසින් සලකා බලනු ලබන්නේ නිර්ධන පාන්තික රාජ්‍ය බලය අරමුණු කර ගත් සංවිධානයක් සතු විය යුතු මූලික ලක්ෂණ පිළිබඳව ය. රාජ්‍ය බලය අරමුණු කර ගත් නිර්ධන පන්ති දේශපාලන ව්‍යාපාරයක් සම්පූර්ණ කර ගත යුතු සාධක ගණනාවක් අතුරින් නිර්ධන පන්ති පක්ෂයක අවශ්‍යතාව ප්‍රමුඛ වේ.**

## නිර්ධන පාන්තික පක්ෂය යනු කුමක් ද?

පක්ෂය යනු පන්තියේ අරමුණු නියෝජනය කරන පන්තියේ දියුණුතම කොටස්වල සංවිධානාත්මක එකතුවයි. එය පන්තියේ සටන් උපකරණයයි. නායකයා සහ මඟ පෙන්වන්නා ද පක්ෂයයි. පහත දැක්වෙන්නේ පක්ෂයක් පිළිබඳ ෆිදෙල්ගේ අවධාරණයකි.

"පක්ෂය ජනතාවගේ පෙරමුණු බලඇණියයි. ජනතාවගේ ආරක්ෂාවේ පළිහයි. පෙරමුණු බලඇණියක් බඳු පක්ෂයක් තිබීම අතිශය මූලධාර්මිකයි. විප්ලවය ආරක්ෂා කරන්නේ කවුරුන් දැයි ඔබ දන්නෙහි ද? ඒ පක්ෂයයි.

"විප්ලවයට ස්ථාවරභාවයක් සහ පැවැත්මක් ලබා දෙන්නේ කවුරුන් ද? ඒ පක්ෂයයි. විප්ලවයට අනාගතයක් සහතික කරන්නේ කවුරුන් ද? ඒ පක්ෂයයි. විප්ලවයට ජීවය ලබා දෙන්නේත්, විප්ලවයට අනාගතයක් දෙන්නේත් පක්ෂයයි. පක්ෂයෙන් තොර විප්ලවය නොපවතී."

(ෆිදෙල් කස්ත්‍රෝ - 1974 මාර්තු 14.)

පක්ෂයක් ගොඩනැගෙන්නේ සාමාජික, සාමාජිකාවන්ගෙන්, ඔවුන්ට නායකත්වය දෙන නායක මණ්ඩලවලින් සහ නායකයන්ගෙනි.

මෙම නිර්ධන පන්ති පක්ෂය පවත්වාගෙන යාමේ දී නිවැරැදි න්‍යායක් තිබීම සහ න්‍යාය නිවැරැදිව භාවිතාවට නැඟීමට සමත් නිර්මාණශීලී නායකත්වයක් තිබීම මෙන්ම ඒ සඳහා කැපවූ වෘත්තීය විප්ලවවාදීන් පිරිසක් සිටීම ද අත්‍යවශ්‍ය වේ. ඒ පිළිබඳ ලෙනින්ගේ අදහස මෙසේ ය:

"විප්ලවීය න්‍යාය නොමැතිව විප්ලවවාදී ව්‍යාපාරයක් තිබිය නොහැකි ය.

"අපට මෙහි දී සඳහන් කිරීමට අවශ්‍ය වන්නේ පෙරමුණු සටන්කරු කාර්යභාරය ඉටු කිරීමට හැකි වන්නේ ඉතාමත් දියුණු න්‍යායෙන් මඟපෙන්වීම ලබන පක්ෂයකට පමණක් ය යන්න පමණි."

(ලෙනින්, තෝරා ගත් කෘති, 01 වෙළුම, 136-137 පිටු)

පසුව භාවිතාව ගැන ලෙනින් මෙසේ කියයි:

**"නිවැරැදි විප්ලවවාදී න්‍යායක් තිබිම එම කොන්දේසි නිර්මාණය වීමට පහසුවක් වන නමුත්, න්‍යාය ඇදහිල්ලක් නොවන්නේ ය. න්‍යාය එහි අවසන් හැඩහුරුව ලබන්නේ සැබැවින් ම පොදුජන සහ සැබැවින් ම විප්ලවවාදී ව්‍යාපාරයක ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය හා සමඟ සමීප සම්බන්ධයක් ඇතිව පමණකි."**

(ලෙනින්, තෝරා ගත් කෘති, 01 වෙළුම, 135 පිටුව.)

### එසේ ම වෘත්තීය විප්ලවවාදීන්ගේ අවශ්‍යතාව පිළිබඳව ද ලෙනින් පැහැදිලි කළේ මෙසේ ය:

"සංවිධාන සම්බන්ධයෙන් මා ඥානවන්තයන් යනුවෙන් සඳහන් කරන්නේ වෘත්තීය විප්ලවවාදීන් ය." ඔවුන් සංවිධානය වී ආවේ ශිෂ්‍යයන් අතරින් ද නැතහොත්, කම්කරුවන් අතරින් ද යන්න නොතකා එම හැඳින්වීම කර තිබේ.

1. "අවිච්ඡේදව පවත්වාගෙන යනු ලබන නායකයන්ගේ සංවිධානයක් නොමැතිව කිසි ම විප්ලවවාදි ව්‍යාපාරයකට පැවැතිය නොහැකි බවත්;

2. "ව්‍යාපාරයේ පදනම වන සහ අරගලයට සාංසිද්ධික වශයෙන් ඇදී එන පොදු ජනකාය පුළුල් වන තරමට (විවිධ වර්ගයේ කෛරාටිකයන්ට වඩාත් නොදියුණු පොදුජන කොටස නොමඟ යැවීම ඉතා පහසු වන නිසා) එවැනි සංවිධානයක අවශ්‍යතාව වඩාත් හදිසි වන බවත්, එය වඩාත් ශක්තිමත් විය යුතු බවත්;

3. "එවැනි සංවිධානයක් ප්‍රධාන වශයෙන් ම සමන්විත විය යුත්තේ වෘත්තියක් වශයෙන් විප්ලවවාදී කටයුතුවල යෙදී සිටින අයගෙන් වන බවත් මම ස්ථිර වශයෙන් ප්‍රකාශ කරමි."

(ලෙනින්, තෝරා ගත් කෘති 01 වෙළුම, 247 පිටුව.)

මේ අනුව සංවිධාන මූලධර්මය ලෙස ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතභාවය මත ගොඩනඟන සංවිධානයක් තිබීම, එයට නිවැරැදි න්‍යායකින් මඟපෙන්වීම මෙන් ම වෘත්තීය විප්ලවවාදීන්ගෙන් සමන්විත වීම නිර්ධන පන්ති පක්ෂය සතු මූලික ගුණාංග යි. මෙම සමස්ත ගුණාංග අඩංගු පක්ෂයක් බොල්ෂෙවික් පක්ෂයක් ලෙස හඳුන්වන අතර මෙම බොල්ෂෙවික් සංකල්පය තුළ ගැබ්වී ඇති දේශපාලන හරය වන්නේ,

**සමාජ පරිවර්තනයකට නායකත්වය දිය හැකි ඒ සඳහා පන්ති බලවේග සංවිධානය කරගත හැකි හා ඒවා මෙහෙය විය හැකි අයෝමය විනයක් සහිත ප්‍රජාතන්ත්‍රවාදී ලෙස මධ්‍යගත සංවිධානයක් යන්නයි. ඒ අතරම එය තත්වයන් මත උපක්‍රම වෙනස්කර ගැනීමේ මෙන්ම එක් උපක්‍රමයක සිට තවත් උපක්‍රමයකට මාරුවීමේ නම්‍යතාවයද සහිත සංවිධානයක් විය යුතුය, තවදුරටත් එය කේඩරීය සීමාව ඉක්මවා ගිය පුළුල් බහුජන සංවිධානයක් ද විය යුතුය.**



**"බලය අල්ලා ගැනීම සඳහා කරන සටනේ දී නිර්ධන පන්තියට සංවිධානය හැර අන් අවියක් නොමැත. ධනවාදී ලෝකයේ අරාජිකවාදී තරගයේ පාලනය නිසා අසමඟි වී සිටින, ප්‍රාග්ධනය සඳහා බලහත්කාරයෙන් ශ්‍රමය වැය කිරීමට යට වී සිටින, අන්ත දුගීබවේත්, ම්ලේච්ඡත්වයේත්, දිරාපත් වීමේ 'පාතාලයට' නිරතුරුව ම තල්ලු කරනු ලබන නිර්ධන පන්තිය නොවැළැක්විය හැකි සේ අනභිභවනීය බලවේගයක් බවට පත් විය හැක්කේත්, එසේ වනුයේත් මාක්ස්වාදී මූලධර්ම මත ගොඩනඟන දෘෂ්ටිමය සමඟි කිරීම මඟින් පමණි."**

**(ලෙනින්, තෝරා ගත් කෘති, 02 වෙළුම, 234 පිටුව.)**